
නිපුනතාව - 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම - විස්මය නැමැති ස්ථායි භාවය නිරූපණ කරමු.

අප ජීවත් වන පරිසරය තුළ විවිධ පුද්ගලයින්ගේ හැසිරීම් රටා, ගමන් විලාස, කතා විලාස ඇතුලු විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙනු කොතෙකුත් දැක ඇත. එසේ දකින, අසන .දැනෙන ආදී වශයෙන් වූ පුද්ගල බද්ධ ක්‍රියාවලින් හේතු කොටගෙන සිතේ කිසියම් සංවේදී ස්වභාවයක් ජනිත වේ. එම තත්වය රසය යනුවෙන් අර්ථ දැක්විය හැකිය. නැටුමක නාට්‍යයක හෝ චරිත නිරූපණයකදී භාව ප්‍රකාශන මගින් එහි අලංකාරය වඩාත් තීව්‍ර වේ. භරත මුනිවරයාගේ **නාට්‍යශාස්ත්‍රය** නම් කෘතියේ රස නවයක් සහ රස නවයට මූලික වන ස්ථායි භාවයන් පිළිබඳ විස්තර කරයි. රස භාව එකිනෙකට බැඳී පවතින බවත්, භාව ඇසුරු කරගෙන රස උපදින බවත් එම විග්‍රහයේ සඳහන් කර ඇත.

ආංගික අභිනයේ දී පුද්ගලයකුගේ සිරුර අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වශයෙන් කොටස් තුනකට බෙදේ. භාව ප්‍රකාශනයේදී සිදුවන්නේ සිරුරේ ඉතා කුඩා කොටස් වන ඇස්, ඇහි බැම, කම්මුල්, නාසය. තොල්, දිව, නිකට ආදී උපාංගයන් ඇසුරු කොටගෙන කිසියම් සිද්ධියක් හෝ අදහසක් ප්‍රකාශ කිරීමකි 8 සහ 9 ශ්‍රේණිවලදී ඔබ රස සහ භාවයන් පිළිබඳ ඉගෙන ගෙන ඇත. මෙම පාඩමෙන් විස්මය නැමැති ස්ථායි භාවය නිරූපණය කරන ආකාරය විමසා බලමු. විස්මය නැමැති ස්ථායි භාවයෙන් උපදින්නේ අත්භූත රසයයි. නුහුරු නුපුරුදු අත්දැකීම්වලට මුහුණ දීම මෙන්ම විස්මය ජනක සහ ආශ්චර්ය ජනක අවස්ථාවලට මුහුණ දීම ආදී විභවයන් නිසා අත්භූත රසය උපදින බව උදාහරණයක් ලෙස පෙන්වා දිය හැකිය.

පහත රූපය ඔබ හොඳින් නිරීක්ෂණය කරන්න.



විස්මය නැමති භාවය නිරූපණය කළ හැකි ක්‍රියාකාරකම්

- ඇස් පළල් කිරීම
- ඇහි බැම ඉහලට එසවීම
- ඇසිපිය නොසලා බලා සිටීම
- ගල් ගැසුනාක් මෙන් නිසලව බලා සිටීම
- ගොත ගැසීම ආදී ආනුභාව මගින් මෙම භාවය නිරූපණය වේ.

කාර්ය පත්‍රිකාව

පියවර

1. ඔබ කැඩපතක් ඉදිරියේ සිට ගන්න.
2. ඇස්, ඇහි බැම, තොල්, කම්මුල් , නිකට.ආදී උපාංගයන් චලනය කරමින් විවිධ හැඩතල මතුකර ගන්න.
3. රූපයේ දැක්වෙන ආකාරයට විස්මය නැමති ස්ථායි භාවය නිරූපණය වන ආකාරයට ක්‍රියාකාරකමෙහි නැවත නැවත යෙදෙන්න.
4. විස්මය නැමති ස්ථායි භාවය නිරූපනය කළ හැකි සිද්ධියක් කෙටියෙන් ගොඩ නගන්න.
5. ගොඩ නගාගත් සිද්ධිය විස්මය නැමති ස්ථායි භාවය නිරූපනය වන ආකාරයෙන් උචිත චලන නිර්මාණය කරමින් චරිත නිරූපණයක් ඉදිරිපත් කරන්න.

ටී.ඒ.කේ ගුණසේකර
නර්තන ගුරු උපදේශක